අ.පො.ස උසස් පෙළ



# ගිණුම්කරණය




## ගිණුම්කරණය ක්‍රියාවලියක් ලෙස විග්‍රහ කිරීම

# 1.3 ගිණුම්කරණය ක්‍රියාවලියක් ලෙස විග්‍රහ කරයි.

## <u>මූලික පද හා සංකල්ප</u>






Copyright © e-thaksalawa.moe.gov.lk

## ගිණුම්කරණ යෙදවුම්

ගිණුම්කරණ යෙදවුම් ලබාගැනීම සඳහා ගිණුම්කරණ ක්‍රියාවලියට ඇතුලත් කරන දෑ ගිණුමකරණ යෙදවුම් ලෙස හැදින්වේ.

ගිණුම්කරණ යෙදවුම් වර්ග 2කින් යුක්ත වේ.

- ගනුදෙනු
- සිද්ධීන්

## ගනුදෙනු

දෙපාර්ශවයක් අතර මුදලින් මැනිය හැකි සම්පත් හුවමාරුවක් ගනුදෙනුවක් ලෙස හැදින්වේ. ගනුදෙනුවක් වාර්තා කිරීමට මූලික ලක්ෂණ 3ක් අවශ්‍ය වේ.

1. මුදලින් අගය කලහැකි බව.
2. සම්පත් වල වෙනසක් සිදුවීම.
3. කළමනාකරණ තීරණයක් වීම.

ගනුදෙනු වලට උදාහරණ -

- අත්පිට විකුණුම් රු. 300000
- බැංකු ණය ගත්තා රු. 200000
- ව්‍යාපාරයේ ප්‍රයෝජනය පිනිස රු. 150000 කාර්යාල උපකරණ මිලදී ගැනීම.




Copyright © e-thaksalawa.moe.gov.lk

## සිද්ධි

සම්පත් හුවමාරුවක් සිදු නොවුවද ව්‍යාපාරයක වත්කම්, වගකීම් හා හිමිකම් කෙරෙහි බලපෑමක් ඇතිකෙරෙන මුදලින් මැනිය හැකි දෑ.

සිද්ධි වලට උදාහරණ -

- පුබුදු ව්‍යාපාරයේ ලි බඩු ක්ෂය රු. 5000
- ණය ගැතියෙකු මියයාම නිසා අයකරගත නොහැකි මුදල රු. 6000
- ගින්නකින් ව්‍යාපාරයේ රු. 8000 තොගයක් හානි වීම.




## ගිණුම්කරණ ක්‍රියාවලිය

ගනුදෙනු හා සිද්ධි යෙදවුම් ලෙස භාවිතා කරමින් ගිණුම්කරණ නිමැවුම් වන මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම දක්වා සිදුකෙරෙන කටයුතු ගිණුම්කරණ ක්‍රියාවලිය වේ.

### ගිණුම්කරණ ක්‍රියාවලිය





Copyright © e-thaksalawa.moe.gov.lk

## ගිණුම්කරණ නිමැවුම්

ගිණුම්කරණ ක්‍රියාවලියේ අවසාන ප්‍රතිඵලය වන්නේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමයි. මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ නිමැවුම් වේ.



ගිණුම්කරණ නිමැවුම්

- ආදායම් ප්‍රකාශන / ලාභ හෝ අලාභ ප්‍රකාශන
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය
- ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්

අන්තර්ගතය - ඩී.එම්.එස්.දිසානායක - කු/මලියදේව පිරිමි විද්‍යාලය , කුරුණෑගල
යූ.බී. ධර්මදාස - අ/තඹුත්තේගම ම.ම. විද්‍යාලය ,තඹුත්තේගම
යූ. අතුල ඒකනායක - මා/ශාන්ත තොමස් ජාතික පාසල , මාතලේ
සැකසුම - එස්.ඒ.පී. රංගන සෙනවීර. - මහ/දොළුව මහා විද්‍යාලය , ගම්පොල.

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk